**ශීර්ෂය 119 - විදුලිබල අමාත්‍යාංශය**

--------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

විදුලිබල අමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරවවිදුලිබල අමාත්‍යාංශයේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 03දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනටවිදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවාදුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය ශීර්ෂය සඳහා වීරමොං පරිපාටිය යටතේ පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා රු. 3,850,000 ක් ද, පරිපූරක ප්‍රතිපාදන යටතේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා රු.2,930,000 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා රු.4,751,362,000 ක් ද, වශයෙන් මුළු එකතුව රු.4,758,142,000 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. මෙය එම වැය විෂයයන් සඳහා වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 18,160 ක් විය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන වෙන් කිරීමේ දී කෙටුම්පත් ඇස්තමේන්තුවේ ඉල්ලුම් කළ ප්‍රතිපාදන සීමාවන් වෙන් නොකිරීම හාඇතැම් වියදම්,වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේ පුරෝකථනය කළ හැකිව තිබූ වියදම් නොවන හෙයින් ඒ සඳහා මු.රෙ. 66 ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ගැනීම හා පරිපූරක ප්‍රතිපාදන යටතේ අමතර ප්‍රතිපාදනය සලසාගෙන තිබීම තාත්ත්වික නොවූ ඇස්තමේන්තු කිරීමක් ලෙස දැක්විය නොහැකි බව. | ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කලයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ශීර්ෂය යටතේ වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.3,350,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී තිබූ අතර, ඉන් සියයට 69 ක් 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මූලධන වියදම් අත්හිටුවීම හේතුවෙන් ඉතිරි වී තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | -එම- |
| (ඇ) | පුනරාවර්ථන වැය විෂයන් 15 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.46,700,000 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු. 36,563,675 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, ඉන් බොහොමයක් රටේ පැවති COVID 19 තත්ත්වය හේතුවෙන් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම සියයට 54 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක විය. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුලධන වැය විෂයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.284,500,000 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.51,546,733 ක ප්‍රතිපාදන 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මූලධන වියදම් අත්හිටුවීම හේතුවෙන් හා රටේ පැවති COVID 19 තත්ත්වය හේතුවෙන් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක විය. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කිරීම හා උපයෝජනය විධිමත් කළයුතු වීම. |
| (ඉ) | අමාත්‍යාංශය විසින් වැය විෂයක් යටතේ වාර්ෂික ඇස්තමේන්තුව මගින්රු. 40,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කරවා තිබූ මුදලින් රු. 28,000,000 ක ප්‍රතිපාදනයක් සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. ඉතිරි ප්‍රතිපාදනය වූ රු. 12,000,000 ක මුදල, වාර්ෂික දායක මුදල් ගෙවීම සඳහා අදාළ බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වන බව. | -එම- |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | මහජනයාට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය වන පසුබිම සැකසීමට අමාත්‍යාංශය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සම්පාදනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයේ පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය සකස් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇති බව. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) ආයතනයට සුවිශේෂී වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවත්, චක්‍රලේඛය අනුව අන්තර්ගත විය යුතු කරුණු ඇතුළත් වන පරිදි සැලසුම සකස්කර නොතිබුණි. | 2021.12.03 දිනැතිව පවත්වනු ලැබූ වැඩමුළුවේ දී ඉදිරිපත් කරන ලද "මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරිම උදෙසා වන මාර්ගෝපදේශ" අනුව සකස් කරන ලද අමාත්‍යාංශ මානව සම්පත් සැලැස්ම - 2022 ලේකම්ගේ අනුමැතියට යොමු කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුවීම. |
| | | (ii) අමාත්‍යාංශයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල්රෙගුලා සි 756(6) | සියලුම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල වාර්තා විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද, අමාත්‍යාංශයේ වාහන වලට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2020 හා 2021 වර්ෂයන්හි විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ වාහන පිළිබඳ සමීක්ෂණ කඩිනමින් සිදු කිරිම සඳහා 2022.01.25 දිනැතිව කමිටුවක් පත්කර අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | අමාත්‍යාංශය සතු සියලු වත්කම් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල්රෙගුලාසි 104(3), (4) | (i) 2020 වර්ෂයේදී සිදු වී තිබූ වාහන අනතුරු 04 කින් අනතුරු 03 ක් සඳහා, සහ 2021 වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 03ක් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විටත් මු.රෙ. 104(4) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | අනතුරුවලට අදාලව ඉදිරියේ දී මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකිරීමට අදාල විෂය භාර නිලධාරියා දැනුවත් කරන ලද අතර මේ වන විට ප්‍රාරම්භක වාර්තා නිකුත් කර පූර්ණ වාර්තා නිකුත් කර නොමැති අනතුරු සඳහා කඩිනමින් මු.රෙ.104(4) ප්‍රකාර පරීක්ෂණ පවත්වා අදාල වාර්තා නිකුත් කිරිමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව වාහන අනතුරු සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාව දින හතක් ඇතුළත, හා මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් මාස තුනක් ඇතුළත දී ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 සහ 2021වර්ෂවලට අදාළව එම වාර්තා නියමිත කාලවකවානු වලදී ඉදිරිපත් කර නොතිබුණි. | - එම - | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 1646 | සියළුම සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් සෑම මසක් අවසන් වීමෙන් පසු ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, 2020 හා 2021 වර්ෂවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂයන්ට අදාළ දෛනික සටහන් නොපමාව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි. | මේ වන විට රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇතිබව. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කර නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ඇතුළත් ක්‍රියාකාරකම්වල විස්තරාත්මක ප්‍රගතිය ප්‍රමාදයකින් තොරව විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය, අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිලාභ ලබා ගැනීම ආදිය පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2021.12.31 දින වන විට අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය, 2021 කාර්යසාධන සැලැස්මේ කෙටුම්පත මඟින් වාර්තා කොට ඇත. ඊට අමතරව විවිධ අංශවල ක්‍රියාකාරකම්වල සවිස්තර ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් විගණනයට ලබා දීමට කටයුතු කරන ලදි. | වර්ෂයට අදාලව අමාත්‍යාංශයක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා වූ ප්‍රගතිය පිළිබඳ වාර්තාව සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

**3.2.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **මෙ. වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම** | | |
| • මෙ. වො. 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක මොරගොල්ල | 2020 හා2021 වර්ෂයේ දී පැවති COVID 19 වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කොට තිබූ පරිදි ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය කරා | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු |

| | | |
|---|---|---|
| ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂ 3 ක ප්‍රමාද කාලයකින් පසුව මෙහි වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැයරු. මිලියන 18,809 ක් වූ අතර, මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන්රු. මිලියන 28 කට ආසන්න මුදලක් (USD 177,931) දණ්ඩන ලෙස (commitment charges) ගෙවීමට සිදු වී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 5,806 ක් වැය කර තිබු අතර, භෞතික ප්‍රගතිය සියයට 30 ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි. | ළඟාවීමට නොහැකි වී ඇති අතර ව්‍යාපෘතිය 2023 නොවැම්බර් මස30 වන විට නිම කිරීමට සැලසුම් කොට ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන යනු ලබන බව. | වීම. |
| • 2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා භෞතික ප්‍රගතිය සියයට 3 ක් තරම් අඩු අගයකින් වර්ධනය වී තිබූ මෙම ව්‍යාපෘතිය 2023නොවැම්බර් 30 වන විට ජනන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, එම ඉලක්කය වෙත ළඟා වීමේ හැකියාව පිළිබඳව විගණනයේදී තහවුරු නොකෙරුණි. | නියමිත කාලය තුළ දී නිම කිරීමට අවශ්‍ය උපරිම උත්සාහය ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ කමිටුව විසින් ගෙන ඇති බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) **ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය** | | |
| බස්නාහිර, මධ්‍යම හා උතුරුමැද පළාත්වල ජාල උපපොළ ධාරිතාවය ඉහළ නැංවීම හා සම්ප්‍රේෂණ හානි අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 37,285 ක් වූ අතර, මෙය 2015 ජනවාරි මස ආරම්භ කර 2018 ජනවාරි මස නිම කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 48 ක් පමණ වූ අතර, වසර 4 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ මුදල රු. මිලියන 15,888 ක් විය. | ව්‍යාපෘතිය 2021දෙසැම්බර් වන විට නිමකිරීමට සැලසුම් කර තිබුනද, 2020 හා 2021 වර්ෂවල උද්ගත වූ COVID19 වසංගතය හේතුවෙන් සැලසුම් කළ පරිදි අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගත නොහැකි වූ අතර ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම් ලබා ගැනීමට යාමේ දී සිදුවූ ප්‍රමාද වීම හාසාමාජීය ගැටළු උද්ගතවීම හේතුවෙන් ද, සැලසුම් කළ පරිදි ඉදි කිරීම නියමිත දිනට ආරම්භ කිරීමට නොහැකි විය.<br>ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ අංශයට අනුව ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා 2023 දෙසැම්බර් දක්වා කාලය අවශ්‍ය වන බව දන්වා ඇත. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) **මෙ.වො. 35 ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය**<br>මෙගාවොට් 35 ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 9,424 ක් වූ අතර, මෙම ව්‍යාපෘතිය 2013 අගෝස්තු මස ආරම්භ කර 2017 අගෝස්තු මස නිම කිරීමට නියමිතව තිබුණි. එහෙත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් වසර 4 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබූ මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර, අදාළ ණය මුදල නිසි පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා චීනයේ කාර්මික හා වාණිජ බැංකුව (ICBC) වෙත ආසන්න වශයෙන් එ.ජ.ඩො. 1,197,199.67 ක පමණ මුදලක් 2019 දෙසැම්බර් 16 වන විට දණ්ඩන ලෙස (Commitment chargers) ගෙවා තිබුණි. | ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම, සාමාජීය ගැටළුඋද්ගතවිම සහ 2016 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ අවසන් විගණන මූල්‍ය වාර්තාව නිකුත් වීමට ප්‍රමාද වීම හේතුවෙන් ICBC බැංකුව විසින් මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බල පෑ මූලික හේතූන් විය.<br>2018 වර්ෂයේ ජනවාරි මස ණය ගිවිසුම කල් ඉකුත් වීමත් සමඟම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සලසා ගැනීමේ අපහසුතාවයන් හා ප්‍රමාදයන් හේතුවෙන් මෙන්ම 2020 වර්ෂයේ සිට මෙරටට බල පෑ COVID 19 වසංගත තත්ත්වය වැනි හේතූන් මත ව්‍යාපෘති නිම කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදු වුණ අතර ණය ගිවිසුම ද, දීර්ඝ කිරීම සිදු විය. එම කාලය තුළ දණ්ඩන (Commitment Charges) ගෙවීමට සිදුව ඇත.<br>2022 ජනවාරි මස ජල විදුලි බලාගාරය බලගන්වා ජාතික විදුලි ජාලයට සම්බන්ධ කොට ඇති අතර මේ වන විට එය එහි පූර්ණ ධාරිතාවයෙන් විදුලි ජනන මෙහෙයුම් ක්‍රියාත්මක කරන බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2.2 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලිබල උත්පාදනය මගින් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීමේ අරමුණින් නාගදීප, අනලතිවු හා ඩෙල්ෆ් යන කුඩා දූපත් තුනෙහි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,980 ක් වූ අතර, අදාල ව්‍යාපෘතිය 2019 වර්ෂයේ ආරම්භ කර 2022 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණද,2021 දෙසැම්බර් 31 වන විටත් ටෙන්ඩරය ප්‍රදානය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | ඉන්දියානු රජය විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව, ඉන්දීය රජයේ ණය මාලාව යටතේ (25%) හා ඉන්දීය ප්‍රධාන (75%) යටතේ මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කොට ඇත. මෙම ව්‍යාපෘතියේ කටයුතු සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන, රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධානය කර ඇත. ඒසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනට විදුලිබල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ වටිනාකම රු.365,700,000 ක් වූ වාහන 42 කින් වටිනාකම රු.227,700,000 ක් වූ වාහන 19 ක් භෞතිකව අමාත්‍යාංශය සතුව නොපැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ. | | |
| (i) වටිනාකම රු.94,000,000 ක් වූ වාහන 03 ක් පවරාදීමකින් තොරව ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙනතිබුණි. | මෙම රථ නැවත විදුලිබල අමාත්‍යාංශය වෙත භාර දීමට කටයුතු කරන ලෙස දන්වමින් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ලිපි මඟින් දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) මහනුවර මහාධිකරණයේ විභාග වන එච්සී 40/16 දරණ අපරාධ නඩුවට අදාළ නඩු භාණ්ඩයක් වන රු.8,500,000 ක් වටිනා JZ – 6200 දරන රථය නඩු කටයුක්ත අවසන් වීමට ද පෙර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත විධිමත්පවරාදීමකින් තොරව ලබා දී තිබුණි. | නඩු කටයුතු අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත රථය පැවරීමට කටයුතු කරන බව . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.. |
| (iii) වටිනාකම රු.125,200,000 ක් වූ වාහන 15 කින් වාහන 04 ක් සූර්යබල, සුළං හාජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට තාවකාලිකව පවරා දී තිබූ අතර,ඉතිරි වාහන 11 පවරා දීම සඳහා 2021 අප්‍රේල් 07 දිනැති අංක විදුලි/ප්‍රවා/94/2020 දරන ලිපිය මගින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා තිබුණි. එසේ වුවද,විගණිත දිනය වන විටත් එම වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා දී නොතිබුණි. | වාහන 11 විධිමත්ව පවරා දීමට සම්පූර්ණ කරන ලද අදාළ ලියකියවිලි සමඟ සූර්යබල, සුළං හා ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2021.04.07 දිනැති ලිපිය මඟින් භාර දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ලංකා විදුලිබල මණ්ඩලය සතු KI - 1239 දරණ මොටර් රථය නිසි පරිදි ලියාපදිංචි අයිතිය පවරා ගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දින වන විට විදුලිබල අමාත්‍යාංශය විසින් පරිහරණය කරමින් පැවති බව නිරීක්ෂණය විය. | KI-1239 අංක දරණ රථය ජොෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) ගේ පරිහරණය සඳහා තාවකාලිකව ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ උමා ඔය ව්‍යාපෘතියට අයත් KI - 3991 දරණ මෝටර් රථය නිසි පවරා ගැනීමෙන් තොරව විදුලිබල අමාත්‍යාංශය ලබාගෙන තිබූ අතර, එම රථය සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. | උමා ඔය ව්‍යාපෘතියට අයත් KI-3991 අංක දරණ රථය තාවකාලිකව විදුලිබල අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති අතර, සූර්යබල, සුළං හා ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත තාවකාලිකව මෙම අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරවරජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම,ඒසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරිම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වව්චර, සහතික කරන චෙක් පත් අත්සන් කරන අයද, සහ ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව රජයේ නිලධාරින් විසින් ඇප තැබිය යුතුවේ. තවද, මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව නිලධාරියෙකු එවැනි තනතුරකට පත් කළ දින සිට දෙමසක් ඇතුළත ඇප තැබිය යුතු වේ. එසේ වුවද, අමාත්‍යාංශය ඇප තැබිය යුතු නිළධාරීන්ගෙන් 7 දෙනෙකු සඳහා පමණක් 2022 පෙබරවාරි වන විට අන්‍යොන්‍යනය ඇපකාර සංගමයේ තාවකාලික සමාජිකත්වය ලබාගෙන තිබූ අතර, අදාළ සියළු නිළධාරීන් සඳහා ඇප තැබිම සම්බන්ධයෙන් වූ කටයුතු අවසන් කර නොතිබුණි. | මේ වන විට අමාත්‍යාංශ නිලධාරින් 12 දෙනෙකු සඳහා අන්‍යෝන්‍ය ඇපකාර සංගමයේ තාවකාලික සාමාජිකත්වය ලබා දී ඇති අතර අදාල අනෙකුත් නිලධාරින් සඳහා එම සාමාජිකත්වය ලබා දීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | අදාළ නිලධාරීන් සඳහා සාමාජිකත්වය ලබාගැනීමට කටයුතු කලයුතු වේ. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2008 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවස්ථා 08 කදී අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් රු.1,584,439 ක අලාභයක් අයකරගත යුතුව තිබුණු අතර, ඉන් රු.1,518,439 ක් වූ සිදුවීම් 07 ක් වසර 10 කට වඩා පැරණි සිදුවීම් විය. | අදාල වාහන අනතුරු 07 අතුරින් අනතුරු 05 ක් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගනිමින් නඩු කටයුතු සිදු කරනු ලබන අතර එක් අනතුරක අලාභ අයකර ගත යුතු තැනැත්තා මේ වන විට විදේශ ගතව ඇති බැවින් එම මහතාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබ ඇත. තවද අනෙක් අනතුර සම්බන්ධ මු.රෙ. 104(4) ප්‍රකාර පරීක්ෂණයේ පූර්ණ වාර්තාව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය 2022.02.07 දින ලැබී ඇති අතර ඒ අනුව අලාභ අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | අලාභයන් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගතයුතු බව. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග ක්‍රියාවට නැංවිම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම සඳහා කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන දීර්ඝ කාලය අවම කිරීමට කටයුතු කරන බව ප්‍රතිපත්තියේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වන කාලය අවම කිරීමට අවශ්‍යවන සංශෝධන ශ්‍රී ලංකා විදුලිබල පනත සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන හා විදුලිබල පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය ක්‍රියාවට නැංවීම මගින් අවශ්‍ය මූලික පියවර 2021 හා 2022 වර්ෂ තුළ දී ගෙන ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යන ආයතනවල අවශ්‍යතාවය මත සිදු කෙරුනු මෙම සංශෝධිත විදුලිබල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2022.05.04 දින සභානායක කාර්යාලය වෙත භාර දී ඇත. | ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කලයුතු වීම. |

| | | |
|---|---|---|
| | තවද, මෙම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති විෂය පථය සම්බන්ධයෙන් සම්පූර්ණ ක්‍රියාකාරීත්වය සූර්ය බල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබන බව. | |
| (ii) පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීම සඳහා සුලං, සූර්ය බලය හා වර්ෂාපතනය සඳහා ඵලදායි පුරෝකථන තාක්ෂණයන් හඳුන්වා දෙන බවට ප්‍රතිපත්තියේ ඇතුළත් වුවද ඒ සඳහා මෙතෙක් කටයුතු සිදුවී නොතිබුණි. | අවශ්‍යවන ප්‍රතිපත්තිමය දායකත්වය ලබාදීම එයට අදාළ පරිදි විදුලිබල පනත හා විදුලිබල පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය කිරීම 2021-2022 වර්ෂ තුළ දී සිදු කරනු ලැබ තිබේ.<br><br>මෙම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධන විෂය පථය සම්බන්ධයෙන් සම්පූර්ණ ක්‍රියාකාරීත්වය සූර්ය බල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබන බව. | ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කලයුතු වීම. |
| (iii) තවද, මෙම ප්‍රකාශනයේ ඇතුළත් කාර්යසාධන කාලරාමුව සෑම වසර දෙකකට වරක්ම සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව දක්වා තිබුණද, 2021 අගෝස්තු 09 දින වන විට වසර 02 ක් ඉක්මවා ගොස් ඇති මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ කිසිදු සංශෝධනයක් සිදුකර නොතිබුණි. | පසුගිය දෙවසර තුළ මෙහි සංශෝධන සිදු කිරීමට අවස්ථාවක් හෝ අවකාශයක් නොලද මුත් ඉදිරි වසර තුළ සමාලෝචනයක් සිදු කිරීම මගින් අවශ්‍ය වන්නේ නම් ඒ අනුව යෝග්‍ය පරිදි සංශෝධනයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග ප්‍රකාශයේ ඇතුළත් කාර්යසාධන කාලරාමුව මගින් ඉලක්ක සහ අපේක්ෂිත ප්‍රතිපත්ති අභිප්‍රායන් සමඟ සම්බන්ධ විය හැකි කාලරාමු හා ප්‍රතිපත්ති අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීමේ වගකීම එක් එක් ආයතන වෙත පවරා ඇත. ඒ අනුව, විදුලිබල අමාත්‍යාංශය විසින් බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම හා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ඉලක්ක හා සංධිස්ථාන සාක්ෂාත් කර ගත යුතුව තිබුණද, එම වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටුවී නොතිබූ බව නිරීක්ෂණය විය. | | |

| | | |
|---|---|---|
| (i) කලාපයේ පවතින රටවල් සමග මායිම් හරහා විදුලි සම්ප්‍රේෂණය කිරීමේ ආර්ථික ශක්‍යතාව 2021 වර්ෂය අවසන් වන විට අධ්‍යයනය කර ලේඛනගත කිරීම. | කලාපයේ පවතින රටවල් සමඟ මායිම් හරහා විදුලිය සම්ප්‍රේෂණය කිරීම අධ්‍යයනය කිරීම සම්බන්ධව කටයුතු දිගින් දිගටම සිදු කරමින් පවතින බව. | ප්‍රතිපත්තියේ ඇතුළත් ඉලක්ක හා සංධිස්ථාන නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (ii) බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධනය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කළ හැකි අභ්‍යන්තර හා බාහිර අවිනිශ්චිතාවයන් පිළිබඳ සොයාබැලීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ප්‍රමාණවත් නියෝජනයක් සමඟින් "බලශක්ති ක්ෂේත්‍ර අවධානම් ඇගයීමේ මණ්ඩලය" ලෙස නම් කරන උසස් මට්ටමේ ස්ථාවර කාරක සභාවක් 2019 වර්ෂය අවසන් වන විට පිහිටුවීම. | පසුගිය 2020 – 2021 දෙවසර තුළ පැවති අර්බුදකාරී තත්ත්වය මත මේ සම්බන්ධයෙන් එක් වී සාකච්ඡා කිරීම, රැස්වීම පැවැත්වීමට තිබූ අපහසුතාවය සහ අනෙකුත් නොවැළැක්විය හැකි හේතූන් මත අපහසු වී ඇති මෙම කාර්ය මෙම වසර තුළ සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම දැනට සිදු කරමින් පවතින බව. | ප්‍රතිපත්තියේ ඇතුලත් ඉලක්ක හා සංධිස්ථාන නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කලයුතු වීම. |
| (iii) පොදු ස්ථාන ආලෝකකරණය ඇතුළුව ග්‍රාමීය, නාගරික හා ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිති 2020 වර්ෂය තුළ හඳුන්වාදී අනිවාර්ය පදනමින් ක්‍රියාවට නැංවීම. | 2019 වසරේ සිට මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශ ලේකම්ගෙන් මූලිකත්වයෙන් පළාත් පාලන අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යන ආයතනවලට සම්බන්ධ නිලධාරීන් එක්රැස් කර රැස්වීම් පවත්වා මේ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන ලදී. මෙම වසර තුළ අදාළ ආයතනයන්හි එකඟතාවය මත පොදු ස්ථාන ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිති හඳුන්වා දීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | ප්‍රතිපත්තියේ ඇතුලත් ඉලක්ක හා සංධිස්ථාන නියමිත පරිදි සාක්ෂාත් කර ගැනීමට කටයුතු කලයුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 104 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 86 ක් වූයෙන් පුරප්පාඩු 18 ක් නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු අතුරින් අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරියෙකු ලද වහාම පත්කර එවන බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් දන්වා එවා ඇති අතර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරෙහි | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | 2020.07.07 දින සිට රාජකාරි ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිලධාරිනියක පත් කිරීමට කටයුතු කර ඇත. තවද, අභ්‍යන්තර විගණක, සහකාර අධ්‍යක්ෂක, අතිරේක ලේකම් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) යන තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම, ප්‍රධාන ගණකාධිකාරි සහ සහකාර ලේකම් (පාලන) යන තනතුරුවල පැවති පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ වී ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 8 ක් නිරීක්ෂණය වූ අතර එයින් අතිරේක ලේකම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන), අධ්‍යක්ෂ ජනරාල්, සහකාර අධ්‍යක්ෂක හා අභ්‍යන්තර විගණක යන තනතුරු 2022 ජුනි 01 දින වනවිටත් පුරප්පාඩුව පැවතුණි. | - එම - | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | අමාත්‍යාංශයේ තෘතීය මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාව 4 ක් වූ අතර, එම මට්ටමේ තනතුරු සියල්ල එනම් පරිපාලන නිලධාරී, භාෂා පරිවර්තක තනතුරු 2 ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී තනතුරක් 2020 වර්ෂයේ සිට මේ දක්වා පුරප්පාඩුව පැවතුණි. | තෘතික මට්ටමේ තනතුරු වන පරිපාලන නිලධාරි තනතුර හා භාෂා පරිවර්තක තනතුරු 02 සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු සිදු කර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරෙහි රාජකාරි ඉටු කිරීම සඳහා 2021.09.04 දින සිට වසරක් හෝ පුරප්පාඩුව සම්පූර්ණ වන දිනය හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා රාජකාරි ඉටුකිරීමට පත්කිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබා දී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍ය කාර්යය මණ්ඩලයෙහි අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් 14 දෙනෙකු අමාත්‍ය කාර්යය මණ්ඩලයෙහි සේවයට යොදවා ගෙන තිබූ අතර, ඇතැම් නිලධාරීන් 2019 වර්ෂයේ සිට අමාත්‍ය කාර්යය මණ්ඩලයට අනුයුක්තව තිබුණි. | ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා සේවා අවශ්‍යතාව මත ලංකා විදුලිබල මණ්ඩලයට අයත් දත්ත සැකසුම්කරු, පාලන සම්බන්ධිකාරක, ලිපිකරු, යතුරු ලේඛිකා, කාර්යාල සේවක, ආරක්ෂක නියාමක සහ රියදුරු යන තනතුරු සඳහා අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත. | 2003 ජුනි 02 දිනැති PED/12රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් 18 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයට යොදවා ගෙන තිබූ අතර ඇතැම් නිලධාරීන් 2009 වර්ෂයේ සිට අමාත්‍යාංශයට අනුයුක්තව තිබුණි. | අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ පවතින තනතුරක රාජකාරි ආවරණය කිරීම සඳහා සේවා අවශ්‍යතාව මත දත්ත සැකසුම් ක්‍රියාකරු තනතුර දරන්නා අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇති අතර ඔහු මාධ්‍ය ඒකකයේ රාජකාරි සඳහා අනුයුක්තව අත්‍යාවශ්‍ය රාජකාරී ඉටු කරනු ලබයි.<br>ලංකා විදුලිබල මණ්ඩලයට අයත් කාර්යාල සේවකයින් 02 කු මෙම අමාත්‍යාංශය සඳහා අනුයුක්ත කර ගැනීම සිදු කර ඇති අතර අමාත්‍යාංශය යටතේ ආරක්ෂක ඒකකයක් නොමැති බැවින් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ආරක්ෂක අංශයෙන් මෙම අමාත්‍යාංශයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීන් අමාත්‍යාංශයට අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත. | 2003 ජුනි 02 දිනැති **PED/**12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |